# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/16 – 2019 මැයි 13 වැනි සඳුදා – 2019.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, වලස්ගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MR/DKW/2017/590 හා 2018.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අක්ෂර 'ඒ' – අරුවේගහහේන – ප්‍රමාණය: හෙක්. 0.4654**
උතුරට: ලීලානන්ද මුතුකුමාරණ හිමිකම් කියන වැලිගොන්නහේන සහ එම්. එම්. ලීලාරත්න හිමිකම් කියන විල්ලපත්තිනිගහවත්ත; නැගෙනහිරට: එම්. එම්. ලීලාරත්න හිමිකම් කියන විල්ලපත්තිනිගහවත්ත; දකුණට: එම්. එම්. ලීලාරත්න හිමිකම් කියන විල්ලපත්තිනිගහවත්ත, ඕ. පී. අනුර හිමිකම් කියන විල්ලපත්තිනිගහවත්ත, බී. යූ. සුමතිපාල හිමිකම් කියන ඉඩම සහ හිමිකම නොදන්නා කළුවගහකොරටුව; බටහිරට: හිමිකම නොදන්නා කළුවගහකොරටුව, කැබලි අක්ෂර බී සහ බී. එම්. පියසිරි හිමිකම් කියන ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – කළුවගහකොරටුව – ප්‍රමාණය: හෙක්. 0.0113**
උතුරට: බී. එම්. පියසිරි හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: හිමිකම නොදන්නා කළුවගහකොරටුව සහ මාර්ගය; බටහිරට: හිමිකම නොදන්නා කළුවගහකොරටුව.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2015/වීඊ/40.
2019 මාර්තු මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 739